# පබ්බත විහාර යනු පර්වත විහාර නොවේ.

මහාචාර්ය අනුර මනතුංග

පුරාවිද්‍යා අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

පබ්බත විහාර යනු අනුරාධපුර යුගයේ අවසන් කාලයේ දියුණුව පැවති විහාරාරාම වර්ගයකි. අනුරාධපුර නගරයේ කේන්ද්‍රයෙන් බැහැරවත්, පිටපළාත්වලත් මෙම වර්ගයේ විහාරාරාම පිහිටා තිබේ. මේවා 'පබ්බත විහාර' නමින් හඳුන්වා ඇත්තේ 'පර්වත විහාර' යන සංස්කෘත වචනය ඇසුරින් බව මෙතෙක් මේ පිළිබඳව අදහස් දැක් වූ සියළු දෙනාගේම විශ්වාසය විය. එහෙත් එය එසේ නොවන බව පෙන්වා දීම මේ ලිපියේ අරමුණය.

පබ්බත විහාර වර්ගයේ විහාරාරාම මුල්වරට 1891 දී එච්.සී.පී. බෙල් අනුරාධපුර විජයාරාමයේ දී හඳුනාගනු ලැබීය. ඒ විහාරාරාම වර්ගය 'පබ්බත විහාර' යන නමින් මුලින්ම හඳුන්වා දුන්නේ 1940 ගණන්වල මුල දී ශිලාලේඛනයක් ආශ්‍රයෙන් පාචීන තිස්ස පබ්බත විහාරය හඳුනාගත් පරණවිතාන විසිනි. වංශ කතාවල විටින් විට සඳහන් වන 'පබ්බත විහාර' යන වචනයත් ශිලාලේඛන වල දැක්වෙන 'පව් වෙහෙර' යන්නත් සමාන බව තේරුම් ගත් පරණවිතාන එම නම සංස්කෘත පර්වත යන්නෙන් බිඳුනු බව විශ්වාස කළේය.

එහෙත් පබ්බත විහාර ලෙස හඳුනා ගත් විහාරාරාම කිසිවක් ඒවායේ පිහිටීම සලකා බලන විට පර්වත සමඟ සම්බන්ධයක් නැති බව කාටත් පැහැදිලි විය. 'පබ්බත' යනු 'පර්වත' යන්නෙන්ම නිපන් ලෙස තිබුණු දැඩි විශ්වාසය නිසා මෙම විහාරාරාම සමඟ පර්වතවල පැවති අදෘශ්‍යමාන සම්බන්ධතාවයක් පිළිබඳව විද්වතුනු කල්පනා කළහ.

පී.එල්. ප්‍රේමතිලක සහ රෝලන්ඩ් සිල්වා මෙම විහාරාරාම ජාවා සහ කාම්බෝජය යන රටවල ඇති 'Mountain Monastraries' සමඟ සම්බන්ධ කිරීමට තරම් දුර ගියහ. සේනක බණ්ඩාරනායක 'Rock Monastaries' ලෙස මේවා හැඳින් වූ අතර පර්වත සමඟ මේවායේ දෘශ්‍යමාන සම්බන්ධයක් නැතත් පැරණි යුගයේ පර්වත ආශ්‍රිතව නිර්මාණය වූ විහාරාරාම පිළිබඳ මතකය අනුව එම නම තවදුරටත් පවත්වාගෙන යන්නට ඇතැයි පවසා ඇත.

පබ්බත විහාර ලෙස හඳුනාගෙන ඇති අනුරාධපුරයේ ඇති විජයාරාමය, පන්කුලිය, පුලියන්කුලම, තොලුවිල, පාචීනතිස්ස පබ්බත විහාරය, වෙස්සගිරිය යන කිසිම ආරාමයක් පර්වත සමඟ සම්බන්ධයක් නැතත් ඒ සියල්ල නගරයේ දුර බැහැර ස්ථානවල පිහිටා ඇති බව ඉතා පැහැදිලිය. එමෙන්ම, මහුල් මහා විහාරය, කළුදිය පොකුණ, මැණික්දෙණ, පදවිය, සීගිරිය වැනි නගරයෙන් බැහැර ස්ථානවල ද මෙම විහාරාරාම පිහිටා ඇත.

මේ අනුව, මෙම විහාරාරාම පබ්බත විහාර ලෙස හැඳින්වීමට හේතුවී ඇත්තේ එය සංස්කෘත භාෂාවෙන් 'කන්ද' යන අර්ථය ඇති 'පර්වත' යන වචනය අනුව නොව 'දුර

බැහැර පිහිටි' යන අර්ථය දෙන '**පාරාවත**' යන වචනය අනුව බව ඉතා පැහැදිලිය. මෙය තේරුම් ගත හැකි වීම නිසා පබ්බත විහාරාරාම පිළිබඳව මෙතෙක් පැවති සාවද්‍ය අදහස් රැසක් නිරවද්‍ය කර ගත හැකිය.

**මූලාශ්‍ර**


Bandaranayake, S.
1974. ***Sinhalese Monastic Architecture.*** Leiden: E.J.Brill.

Bell, H.C.P.
1904. ***Archaeological Survey of Ceylon, Annual report for 1891.*** Government of Ceylon.

Monier – Williams, Monier
1899, ***A Sanskrit – English Dictionary***, Oxford.

Prematilleke, L and Roland Silva.
1968. A Buddhist Monastic type of Ancient Ceylon Showing Mahāyanist Influence. ***Artibus Asiae.*** Vol. xxx. Ascona.

Paranavitana, S.
1950. ***Annual Report of the Archaeological Survey for 1940-1945.*** Government of Ceylon.